## වෂර් 2021 ක්වු පෙබරවාරි මස 18 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08. R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09.M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. D.M දීසායු මංජුල දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11.D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12.D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13.R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.W .ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 22. තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.N.R.M.D නවරත්න රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

| | |
|---|---|
| 24.A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 25. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 26.R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 27.H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 28.K සුප්පයියා ජීවා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 29.මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 30.වඩිවෙල් රවී මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 31.H.G සුසිලාවති මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 32.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 33. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 34. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 35. H.G සුබද්‍රා සමරනායක මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 36.ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 37.පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

| | |
|---|---|
| 38. W.M.G.W.C.B වේරපිටිය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 39.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 40.R.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 41. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 42.G.R චමිලා ෆොන්සේකා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 43.කුමාරවේලු කනගරත්නම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2021 ජනවාරි මස 19 මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා**

2021 ජනවාරි මස 19 මහ සභා වාර්තාව සත්‍ය වාතර්ාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු සුභද්‍රා මන්ත්‍රීතුමිය**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

( 2) විදේශ භාෂා පාඨමාලාව -2021 (ජමර්න්,චීන,හා ප්‍රංශ, භාෂා) යටතේ මධ්‍යම පළාත් වෙළද වානිජ හා සංචාරක දෙපාතර්මේන්තුව මගින් සංචාරක ක්ෂේත්‍රයේ විවිධ රැකියා අවස්ථාවන් ඉලක්ක කර ගනිමින් පාසල් හැර යන තරුණ පිරිසගේ සහ සංචාරක ක්ෂේත්‍රයේ රැකියා වල නිරත වූවන්ගේ භාෂා දැනුම වදර්නය කිරීම සදහා විදේශ භාෂා හැදෑරීමට අවස්ථාවක් ලබා දීමට කටයුතු කර ඇති බවත් මේ වසරේ පාඨමාලාව මාතර්‍ු මස සිට ආරම්භ කරන බැවින් ඉහත භාෂාවන් හැදෑරීමට කැමැත්තක් දක්වන මධ්‍යම පළාත තුල පදිංචි අය 2021.02.28 දිනට පෙර ඉල්ලුම්පත් යොමු කරන ලෙස දන්වා ඇති නිවේදනය සභාගත කරන ලදි.

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සදහන් කරන ලදි.

4.කල් දී ඇති ප්‍රශ්න -

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**කල් දී ඇති ප්‍රශ්න** යටතේ ගියවර සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටි මාගර් නඩත්තු ඒකකය ආරම්භ කිරීම සදහා අවශ්‍ය අංගනය සභාවෙන් ඉදිකරන බවත් සභාවේ දැනට සේවය කරන කම්කරුවන් එම නඩත්තු කටයුතු සදහා සහභාගී කර ගන්නා බවත් අවශ්‍ය අමුද්‍රව්‍ය මිලට ගන්නා බවත් ගල්රෝල ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව නිවැරදි ලෙස මිලදී ගන්නා බවත් පවසමින් උඩපළාත ප්‍රාදේශීය සභාවේ නඩත්තු ඒකකයේ ව්‍යාපෘති වාර්තාව සභා ගත කරන ලදි.

5.කල් දී ඇති යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1)

5(1.1) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2020.12.31 දක්වා වූ භාණ්ඩ සමීක්ෂණයේ නිදෙර්ශ ක්‍රියාත්මක කිරීමේ කමිටු සාමාජිකයින් ලෙස ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුත්, තක්සේරු කමිටුව සඳහා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුත්,පත්කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.



<u>ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා</u>

උඩපළාත ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණයේ නිදෙර්ශ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා සහ ගරු උප සභාපති අසේල අමරසේන මහතාත් තක්සේරු කමිටුව සඳහා ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා සහ ගරු අගලවත්ත මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු ඩිමෝෂී ඥාණලතා මන්ත්‍රීතුමිය</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මේ පිලිබඳව සලකා බැලූ මහ සභාව *මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව තීරණය* කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (2)</u>

5(1.2) උඩපළාත ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කායර්ාලය පුස්සැල්ලාව උප කායර්ාලය ,ආදාහනාගාරය දැල්පිටිය,පුස්සැල්ලාව,දොළුව,වාරියගල,හුනුගල,ග්‍රෝව්හිල් පුස්තකාල වලට අදාව 2020 .12.31 දිනෙන් අවසන් වෂර්යට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාථර්ා පිලිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව තීරණය කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,3)</u>

5(1.3)2020 වෂර්ය සඳහා නාරංවිට පොදු සුසානභූමිය (පොල් එලදාව) බදුදීම වෙනුවෙන් තැන්පත් කරන ලද ගිවිසුම් ඇප මුදල් හා ටෙන්ඩර් ඇප මුදල් හිගයට හිලව් කිරිමේදී වැරදීමකින් වැඩිපුර අය කරගත් රු.990.00ක මුදල හා පුස්සැල්ලාව නව වෙළඳ සංකීණර්යේ A-6 කඩ කාමරය බදුදීම වෙනුවෙන් තැන්පත් කරන ලද ගිවිසුම් ඇප මුදල් හිගයට අයකර ආපසු ගෙවීමේදී වැඩිපුර අය කරගත් රු.17020.75ක මුදල ආදායමෙන් ආපසු ගෙවීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*



<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,4)</u>

5(1.4) ඉහුරුවත්ත පොදු සුසානභූමිය ඉඩම් මැන මායිම් ගල් දමා පිඹුරු සැකසීමේ ගාස්තු රු.54000.00, අන්දනාදෙණිය වත්ත සුසානභූමිය මැනුම් ගාස්තුරු.13440.00, පඹදෙණිය සුසාන භූමියෙහි රේඛා චිත්‍ර ලබාගැනීමේ ගාස්තු රු.666.00,වහුගපිටිය වප්ලි සුසාන භූමිය මැනුම් ගාස්තු රු.54000.00,ගොනටුවෙල පොදු සුසාන භූමිය මැනුම් ගාස්තු රු.3240.00 වන සුසානභූමි සභාව වෙත පවරාගැනීම සඳහා වන මැනුම් ගාස්තු ගෙවීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>**හදිසි යෝජනා**</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,5)</u>

5(1.5) අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපියට අනුව උඩපළාත ප්‍රාදේශීය සභාවට පහතින් දක්වා ඇති පරිදි අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු තවදුරටත් අයකර ගත නොහැකි බැවින් ගිනුමෙන් ඉවත් කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

උසාවි දඩ

| වෂර්ය | අධිකරණය | මුදල |
|---|---|---|
| 2011 | නාවලපිටිය | 28250.00 |
| 2015 | නාවලපිටිය | 3000.00 |
| 2017 | ගම්පොල | 51533.00 |
| 2018 | මහනුවර | 9500.00 |

මුද්දරගාස්තු

| වෂර්ය | අධිකරණය | මාසය | මුදල |
|---|---|---|---|
| 2016 | නුවරඑළිය | පෙබරවාරි | 6500.00 |
| 2016 | අවිස්සාවේල්ල | දෙසැම්බර් | 11000.00 |
| 2017 | නුවරඑළිය | ජනවාරි | 6500.00 |
| 2018 | | පෙබරවාරි | 11000.00 |
| | | මාතර්ු | 6500.00 |

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

උඩපළාත ප්‍රාදේශීය සභාවට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු තවදුරටත් අයකර ගත නොහැකි බැවින් ගිනුමෙන් ඉවත් කර ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.



ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1,6)

5(1.6) පුස්සැල්ලාව පොදු වෙළඳපොල ඉදිකිරීමේදී තාවකාලිකව ලබාදුන් ලැලි කඩහිමියන් දස දෙනා අතරින් මුරුගයියා මයිල් වාගනම් යන අයට ලබාදුන් තාවකාලික කඩ කාමරය දිරාපත්වී ඇති නිසා පාවිච්චි නොකර අතහැර දමා ඇති බවත් නමුත් දැනටත් මාසිකව බිල් කර ලේඛණ ගතකරමින් පවත්වාගෙන යන නිසා ඉදිරියට බිල් කිරීම නතර කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

මෙම ස්ථානයේ කඩය කැඩී ඇත්නම් පාවිච්චි නොකර අතහැර දමා ඇත්නම් තවදුරටත් බිල් කිරීම් කලොත් හිගයක් කඩකුලියට එකතුවන නිසා එම අය එම ස්ථානයෙන් ඉවත්කර බිල් කිරීම නතර කරන ලෙසට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1,7)

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

SPL 82/14 දරණ පුස්සැල්ලාව වෙළඳ සංකීණර්ය සම්බන්ධ නඩුව සදහා නීතිඥ ශාන්ති කුමාර් මහතාගේ උපදෙස් මත අධිනීතිඥ සමන්ත රත්වත්ත මහතා පෙනී සිටින අතර නඩු ගාස්තු වශයෙන් රු.42000.00ක මුදලක් ඉල්ලුම් කර ඇති බැවින් එම මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

තීරණ අංක 05 (2,1)

**<u>ගරු කීතරී මන්ත්‍රීතුමාගේ යෝජනා</u>**

5 (2 .1) උඩපළාත ප්‍රාදේශීය සභාවේ කමර්ාන්ත කමිටුව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ප්‍රාදේශීය සභාවක් ලෙස කෙතරම් වැඩ කටයුතු ඉටු කලත් සෞඛ්‍ය ගැටළු පරිසර ගැටළු සංවධර්නය කලත්



ජනතාව තම භෞතික සම්පත් සංවධර්නය අපේක්ෂා කරන බවත් එසේ නොකලොත් එම සභාව වැඩ නොකල සභාවක් බව සදහන් කරන බවත් ගමේ ළිඳ,පඩිපෙළ, ප්‍රජාශාලාව ආදි ස්ථාන සංවධර්නය කලොත් ජනතාව ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන බවත් ප්‍රාදේශීය සභාවක හදවත ලෙස කමර්ාන්ත කමිටුව සලකන බවත් කමර්ාන්ත කමිටුව ගරු මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කරන ස්ථාන වල එතුමන්ලාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බවත් එසේ නොවන ස්ථාන වල ඇති වන ගැටළුකාරී තත්වයන් වලදී කමර්ාන්ත කමිටුවේ නිරීක්ෂණය යටතේ සභාපතිතුමා,උප සභාපතිතුමා, කාමරීක නිළධාරි යටතේ කමිටුවට ලැබිය යුතු බලතල ලබා දෙන ලෙසත් මාසයකට දෙවතාවක් වත් කමර්ාන්ත කමිටුව ක්‍රියාත්මක විය යුතු බවත් 2021 වෂර්යේ වෙන වෂර් වලට වඩා ඵලදායී සංවධර්නයක් කරා යාමට සියළු දෙනාගේ සහයෝගය බලාපොරොත්තු වන බවත් කමර්ාන්ත ඉටු කිරිමේදී පැන නඟින ගැටළු සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා,ගරු උප සභාපතිතුමා සහ කමර්ාන්ත කමිටුවේ සභාපති ලෙස තමාවද දැනුවත් කරන ලෙසත් ක්‍රියාකාරී කාමරීක නිළධාරි මහත්වරු කිහිප දෙනෙකු සිටින නිසා සවර් සාධාරණ ලෙස සියළුම මන්ත්‍රීවරුන්ට සංවධර්න කටෙුතු සදහා අවස්ථාව ලබා දෙන ලෙසත් කමිටුව නියෝජනය කරන ගරු මන්ත්‍රී මණ්ඩලය අනිවාරයෙර්න්ම කමිටුවට සහභාගී වන ලෙසත් ඉල්ලා සිටිමින් ඒ තුල ක්‍රියාත්මක වීමේදී 2021 වෂර්යට අදාළව සියළුම මන්ත්‍රීවරුන් ලබාදී ඇති සංවධර්න යෝජනා අනුව ක්‍රියාත්මක කල හැකි සියළු කමර්ාන්ත ඉටු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

අපි කුමන කරුණු ගැන කථා කලත් කමර්ාන්ත කමිටුව මාස 6ක් පමණ රැස් නොවූ බවත් ගෙවීමක් අනුමත කරන්න පමණක් කමිටුව රැස් වන බවත් ඉල්ලගොල්ල මාගර්යේ නාය ගිය ස්ථාන ඇති බවත් දැනට වසරක පමණ කාලයක් මේ සම්බන්ධයෙන් කටයුතු අතපසු වි ඇති බවත් එනිසා කමර්ාන්ත කිමිටුව මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය කර පස් කඳු කඩා වැටී ඇති නායගිය ස්ථාන වල ස්ථානීය පරීක්ෂණයක් සිදු කර මේ වසරේ මුල සිටම අත්‍යාවශයෙන්ම කල යුතු කමර්ාන්ත සැළැස්මක් සකස් කර ගත යුතු බවත් ජයතිලක මහතාගේ නැවත පැමිණීම ගැන සතුටු වන බවත් සමහර නිළධාරි දුරකථන ඇමතුමකට පවා ප්‍රතිචාර නොදක්වන බවත් රාජකාරියට මුල්තැන දී කටයුතු ඉටු කරන තැනට නිළධාරින් මෙහෙය වන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී සභාවේ ඉතිහාසයේ මෙවැනි ප්‍රශ්න ඇති නොවූ බවත් තමා මේ දේවල් පිළිබඳව මීට පෙර කථා කල බවත් නිළධාරින් සියළු දෙනාම නොව එක් අයෙකු දෙදෙනෙකුගේ වැරදි නිසා ඔබතුමා සමඟ පවා ගැටළු ඇති කර ගත් බවත් අතපසුවීම්,කමර්ාන්ත ඉටු කිරිමේ ගැටළු වැරදි සහගත දේ නිසා පසුගිය කාලයේ සභාවට පැමිණිමට පවා අකමැති වූ බවත් උඩපළාතේ පවතින ගැටළු වලට සමහර නිළධාරි වගකිව යුතු බවත් ලේකම්තුමියට අපි ගරු කරන බවත් කමර්ාන්ත ඉටු කිරිමේදී 2021 කමර්ාන්ත සියළුම දෙනාට සාධාරණ ලෙස ලබාදී සහයෝගයෙන් කටයුතු කරමු යැයි සදහන් කරමින් මම එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමා</u>**

2020 ණයහිමි කරන ලද කමර්ාන්ත ලෙස අපට එවා ඇතා ලිපියේ සඳහන් කර ඇත්තේ 2021 පෙබරවාරි මාසයට ප්‍රථම වැඩ අවසන් කරන ලෙසට බැවින් මේ සඳහා ගෙවීම් කරනවාද යන්න විමසීමක් කරන ලදි.



<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මේ සඳහා දැනට මුදල් නොමැති හෙයින් මාස 2කින් පමණ මුදල් ලබා දෙන බව සඳහන් කරන ලදි.

**<u>ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමා</u>**

ණයහිමි ලැයිස්තුවේ තමාගේ 2020 සංවධර්න යෝජනා ඇතුළත් වී නොමැති නිසා එම යෝජනා නැවත ඉදිරිපත් කිරීමට හැකි දැයි විමසන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ණයහිමි කර නොමැති කමර්ාන්ත යළි කල නොහැකි බවත් කමිටු 4 සඳහා සභාපතිවරු පත් කර ඇති බවත් කමර්ාන්ත කමිටුව සඳහාද බලය ලබාදී ඇති බවත් එනිසා සභාපතිතුමාට කමිටුව කැඳවා කමර්ාන්ත නිරික්ෂණයට යාමට ප්‍රවාහන පහසුකම් සලසන බවත් සඳහන් කරන ලදි.

**<u>ගරු මංජුල දිසානායක මන්ත්‍රීතුමා</u>**

මේ වන විට ලක්ෂ 2ක මුදලක පමණක් තමා කමර්ාන්ත ඉටු කර ඇති බවත් ඇස්තමේන්තු කිරිම සඳහා කාමරීක නිළධාරි මහතුන් නොපැමිණෙන බවත් ණයහිමි ලැයිස්තුවේ අපේ නම්වත් සඳහන්ව නොමැති බවත් සඳහන් කරන ලදි.

සභාවේ ඝෝෂා..................

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙසට මම යෝජනා කරමි.

<u>ගරු **උප සභාපති අසේල අමරසේන** මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු **උප සභාපති අසේල අමරසේන** මහතා</u>

කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලෙසට මම යෝජනා කරමි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

සමහර කමර්ාන්ත ගිවිසුම් ගත වි ඇති බවත් ක්‍රියාත්මක කිරිමට මුදල් නොලැබුණු බවත් සමහර මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධයෙන් වැටහීමක් නොමැති බවත් කමර්ාන්ත යෝජනා ක්‍රියාත්මක කිරිමට

යමේදි මුදල් නොමැති නිසා කිරිමට නොහැකි වු 2020 වෂර්යේ කමර්ාන්ත අළුත් යෝජනා ලෙස ඉදිරිපත් කර 2021 වෂර්යේ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරි රත්නායක මන්ත්‍රීතුමා

ඉටු නොකල 2020 වෂර්යේ කමර්ාන්ත පමණක් අළුත් යෝජනා ලෙස ඉදිරිපත් කර 2021 වෂර්යේ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.



ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා

කාමරීක නිළධාරි සියළු දෙනා ඊළඟ මස සභාවට කැඳවන ලෙස සඳහන් කරන ලදි.

තීරණ අංක 05 (2,2)

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමාගේ යෝජනා

(5) (2.2) වත්තෙහේන ජල ව්‍යාපෘතිය පිළිබඳව දිගින් දිගට කථා කිරිමට සිදු වි ඇත්තේ C&C සමාගමේ මේ ව්‍යාපෘතියේ වැඩ කරන කෙනෙක් දක්නට නොමැති නිසා බවත් මෙය 2020 දෙසැම්බර් 08 අවසන් කිරිමට තිබු ව්‍යාපෘතියක් බවත් මෙම අය වෂර්ාව සහ කොවිඩ් නිසා එහි කටයුතු නිම නොකල බවත් 2021 මාතර්ු 16 වන තෙක් කාලය දිසර් කරගෙන ඇති බවත් මේ වන විට 30% පමණ වැඩ අවසන් බවත් 70% පමණ කටයුතු ඉටු කිරීමට තිබෙන බවත් මෙම අය කම්කරුවන් යොදවා කාණු කපන්නවත් උත්සහා නොකරන බවත් පළාත් පාලන කොමසාරිස්තුමා විශ්වාස කර කථා නොකල බවත් එනිසා පුරනැඟුම නිළධාරින්,කොන්ත්‍රාත් සමාගම සමඟ විශේෂ සාකච්ඡාවක් කිරිමට අවස්ථාව සලසා දෙන ලෙසත් වත්තෙහේන ජල ව්‍යාපෘතිය සම්බන්ධ ගැටළු පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමා, පුරනැගුම නිළධාරින් සහ කොන්ත්‍රාත් සමාගම දැනුවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

ගියවර කොන්ත්‍රාත් සමාගම වැඩ නොකල මුදල් ලබාගත් බවත් අවසාන චෙක්පත ගැනීමට යන අවස්ථාවේ අපි එය වලක්වා ගත් බවත් මෙවරත් වැඩ අවසන් නොකර මුදල් ලබාගැනීමට ක්‍රමවේදයක් සකස් කර ගෙන ඇති බවත් කොන්ත්‍රාත්කරුවන් විමශර්ණය කිරීමට රජයේ නියෝජිතයන් යොදවා ඇති නිසා කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් කිරීමට මැළි කමක් දක්වන බවත් පුරනැඟුම ජල යෝජනා ක්‍රම වලින් 50%ක සාථර්කත්වයක් අපගේ මැදිහත්වීම මත උඩපළාතේ ජල යෝජනා ක්‍රමය අත් කරගෙන ඇති බවත් නැත්නම් බට හා ටැංකි ටික පමණක් ඉතිරි වන බවත් අපේ ජනතාව උග්‍ර ජල හිගයකින් ස්ටෝෆීල්ඩ් ජනතාව පීඩා විදින බවත් කෝටි 25ක පමණ මුදලක් වියදම් කර සෑදු ජල යෝජනා ක්‍රමයෙන් කොටසකට ජලය ලැබෙන බවත් කොටසකට ජලය නොලැබෙන බවත් එනිසා දැනට ස්ටෝෆීල්ඩ් ගම මැද තිබෙන බට වලින් එම ප්‍රදේශ වලට ජලය ලබා දෙන ලෙසත් කොන්ත්‍රාත් සමාගම සමඟ සාකච්ඡාවක් සඳහා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා කොමසාරිස්තුමාට කථා කල බවත් සභාපතිවරයා ලෙස තමාට මේ සඳහා මැදිහත් විය නොහැකි බවත් සම්පූණර් පාලනයම පුරනැඟුමෙන් සිදු කරන බවත් කිසි අයෙක් ව්‍යාපෘතියේ වැඩ නොකරන බවත් දීසර් කරන්න ක්‍රමවේදයක් නොමැති බවත් මුදල් ගෙවිය නොහැකී වී ඇති නිසා මෙම මාසය තුළ මුදල් ගෙවීම සිදු නොකරන බවත් එසේ නොමැති වුවහොත් නැවත ටෙන්ඩර් කර හෝ ලබන මාසය තුළ කටයුතු නිම කරන බව දැන්වූ බවත් අපට බවුසර් පොයින්ට් එකක් සාදාගන්න තැනක්

නොමැති බවත් ලබන මස සිට බවුසර් මඟින් ජලය බෙදාහැරීමට සිදු වන බවත් තමා කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කර මෙම ගැටළුව විසඳන බවත් සඳහන් කරන ලදි.

**හදිසි මන්ත්‍රී යෝජනා**

තීරණ අංක 05 (2,3)

2021.02.18 දිනැති මහ සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව

**ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමාගේ යෝජනා**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ගලහා දෙල්තොට ප්‍රදේශයේ සුසාන භූමියක් ආරම්භ කිරීම සම්බන්ධව අල්හාජ් ජින්නා ස්මයිල් මහතා විසින් එතුමාට අයිති ග්‍රීන්වැලි වත්ත ඉඩමෙන් පර්චස් 60ක පමණ භූමි ප්‍රමාණයක් අල් මස්ජිදුල් අක්රම් ජුම්මා පල්ලිය වෙත පරිත්‍යාග කිරිමට කැමති බවත් හේවාහැට මැතිවරණ කොට්ඨාශයේ ගලහා ප්‍රදේශයේ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ දක්වා දේහයන් භූමදානය කිරීම සඳහා ස්ථානයක් නොමැති හෙයින් ගලහා නගරයේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් වෙන් කර තිබූ සුසාන භූමිය රජයට පවරාගෙන ගලහා පොලීසිය සඳහා ලබාගත් බවත් ඒ වෙනුවට ගලහා නගරයේ සිට සැතපුම් 2ක් ඈතින් දෙල්තොට වතුයාය ඉහළින් ඉඩම් කොටසක් ලබා දුන්නද ගලහා රන්තරු ක්‍රීඩාපිටිය පුළුල් කිරීමේදී මුස්ලිම් සුසාන භූමිය සඳහා වෙන් කල කොටස වැසී ගොස් ඇති නිසා දැනට එම සුසාන භූමිය පර්චස් 10ක වැනි ප්‍රමාණයක් ඉතිරිව ඇති බවත් එම අයට සුසානභූමියට ගොස් අවසන් ගෞරව දැක්වීමට අවස්ථාව නොලැබෙන නිසා ඉහත සඳහන් අය විසින් එම අයට අයිති ඉඩමෙන් පර්චස් 60ක පමණ භූමි ප්‍රමාණයක් ගලහා ප්‍රදේශයේ සහ උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි මුස්ලිම් ජනතාව වෙනුවෙන් පල්ලේ දෙල්තොට වසමේ පිහිටා ඇති ඉඩමේ සුසානාගාරයක් ඉදිකිරීමට කැමති බවත් මෙයින් කිසිදු පරිසර හානියක් සිදු නොවන බවත් එනිසා සභාවේ අනුමැතිය ලබාගෙන ඉඩම වටා තාප්පයක් ඉදිකිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාවට යොමු කරමින් සභා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බැවින් මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස මම දන්වා සිටිමි.

**ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා**

ගලහා පොලිසිය ඉදි කරන අවස්ථාවේදී මෙම අය තම ඉඩම පරිත්‍යාග කල බවත් එවිට ගලහා රෝහල තිබෙන ස්ථානයේ පර්චස් 40ක ඉඩම් කොටසක් සුසාන භූමිය සඳහා ලබාදුන් නමුත් ගලහා රන්තරු ක්‍රීඩා සමිතිය ලක්ෂ 20ක ප්‍රතිපාදන මත ක්‍රීඩා පිටිය සංවධර්නය කිරීමේදී සුසාන භූමිය වෙනුවෙන් ලබාදුන් ඉඩමේ දැනට පර්චස් 07ක ඉඩම් කොටසක් සුසාන භූමිය සඳහා ඉතිරිව ඇති බවත් එක් පැත්තක ඔය සහ අනෙක් පස ජල උල්පත් ඇති නිසාත් භූමිදාන කටයුතු සිදු කිරීමට නොහැකි තත්වයක් උදා වී ඇති බවත් එනිසා අක්කර 07ක ඉඩමක් හිමි මෙම පුද්ගලයා පර්චස් 60ක ඉඩම් කොටසක් පල්ලියට හා ප්‍රාදේශීය සභාවට පැවරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති නිසාත් මෙහි දිය උල්පත් නොමැති බවත් මෙම ඉඩම ගලහා සහ උඩපළාත සීමාව තුළ පිහිටා ඇති බවත් වටගොඩ පල්ලේදෙල්තොට,නව නිල්ලඹ,ගුරුකැලේ වසම යන ස්ථාන වලත් මුස්ලිම් ජනතාව පවුල් 10ක් පමණ පදිංචි වී තිබෙන නිසා මෙම ඉඩම සභාවට පවරනවානම් මුස්ලිම් ජනතාවට සුසානාගාරයක් ඉදිකර ගැනිමට පූවර් කැමැත්ත ප්‍රකාශ කර දෙන ලෙසත් මම යෝජනා කරමි.

**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**

ඉඩම් හිමියෙක් ඉඩම් කොටසක් සභාවට පවරන බවත් මෙම ඉඩම් කොටස පැවරුවායින් පසු සභාවේ වත්කම් වලට මෙම ඉඩම් කොටස එකතු වී එම දේපළ සභාවට අයත් වන බවත් සුසාන භූමි වලට මුදල් වෙන් කරන විට අපට තව සුසාන භූමියක් එකතු වන බවත් පල්ලේ දෙල්තොට වෙදහැට,ගලහා ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව විශාල ලෙස ජීවත් වන බවත් ගරු ජයපති මන්ත්‍රීතුමාගේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මෙම යෝජනාව ගෙනවිත් ඇති නිසා උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නියෝජනය කරන මුස්ලිම් ගරු මන්ත්‍රීවරුන් හා මුස්ලිම් ජනතාව වෙනුවෙන් සභාව මැදිහත් වී මෙම කටයුත්ත ඉටු කර දෙන ලෙස සදහන් කරමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.



<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මේ සදහා විශාල ගැටළුවක් පැන නැගිය හැකි බැවින් යෝජනා ස්ථිර වුවත් ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරන ලෙස සභාවට දන්වන ලදි.

<u>ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමා</u>

මෙම ඉඩමෙහි සුසානාගාරයක් ඉදි කරන්නේ මුස්ලිම් ජනතාව වෙනුවෙන්ම පමණක්මදැයි විමසන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

සභා සම්මත වුවත් මේ සම්බන්ධයෙන් අපි සොයා බැලිය යුතු බවත් සුසානභූමි වල යම් යම් ගැටළුකාරි අවස්ථා පැමිණෙන නිසා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඉන් අනතුරුව අපේ එකඟතාවය ලබාදීම සුදුසු බව තමා අදහස් කරන බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අපි ගරු මන්ත්‍රීවරුන් සමඟ එම ස්ථානයට ගොස් ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට ඒ අනුව කටයුතු කරමු යැයි සදහන් කරන ලදි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

තමා මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම නොකලහොත් අඩුපාඩුවක් බවත් තමාගේ කොට්ඨාශයේද සිංහල සහ මුස්ලිම් ජනතාව 50% බැගින් සිටින බවත් මේ විලසට සුසානභූමි 2ක් ඇති බවත් අපේ කොටසේ අපි අවමංගල කටයුතු කරන බවත් මුස්ලිම් ජනතාවගේ කොටසේ එම අය නඩත්තු කරගෙන සුසානාගාරය සහ මාගර්ය පවා එම අය සකස් කරගෙන විදුලිය පහසුකම් පවා සපයාගෙන රාත්‍රී කාලයේ පවා ආගමික කටයුතු භූමදාන කටයුතු ඉටු කරන බවත් අපේ ප්‍රදේශයේ මාගර්ය සංවධර්නය කරන විට අපේසොහොන් භූමියේ සිංහල අයගේ කොටස මුස්ලිම් අයටත් මුස්ලිම් අයගේ කොටස සිංහල අයටත් වෙන් වන බවත් සිංහල අයට ඉතා කුඩා ඉඩම් කොටසක් ඇති බවත් නමුත් සිංහල ජනතාවට ගැටළු පැන නැගුනත් ගම්පොල ආදාහනාගාරය පවතින නිසා ගැටළු සමනය වී ඇති බවත් මෙම ඉල්ලීම කාලෝචිත බවත් මානුෂිකව වැදගත් ඉල්ලීමක් නිසා මේ පිළිබඳව සලකා බලා මෙම ස්ථානීය පරීක්ෂාවේ කමිටුව සදහා ගරු සභාපතිතුමා ගරු උප සභාපතිතුමා, ගරු අගලවත්ත මන්ත්‍රීතුමා, ගරු උපචන්ද්‍ර මන්ත්‍රීතුමා, ගරු මුරාඩ් මන්ත්‍රීතුමා,ගරු ෆසාල් මන්ත්‍රීතුමා,ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා,ගරු අරුණ මන්ත්‍රීතුමා,ගරු කීතරී මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මොහොමඩ් ෆසාල් මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021.02.23 වන අඟහරුවාදා දින උදේ 9.30ට ස්ථානිය පරීක්ෂාව සඳහා යාමට සියළු දෙනා පැමිනෙන ලෙසත් ඉඩම් හිමිකරුවාටද පැමිණෙන ලෙස දන්වා යවා එම ස්ථානයට ගොස් හැකියාවක් ඇත්නම් සිංහල ජනතාව වෙනුවෙන් පර්චස් 10ක ඉඩම් කොටසක් වෙන් කර ගැනීමට ඉල්ලීමක් කරමු යැයි සඳහන් කරන ලදි.

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

2021.02.18 දිනැති මහ සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව

තීරණ අංක 05 (2,4)

**ගරු උදය දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනා**

පුස්සතැන්න ඉඩම් වෙන්දේසිය ගැන කථා කර සභාවේදී තීන්දුවක් ගත් බවත් එහිදි ප්‍රාදේශීය ලේකම් කායර්ාලය,මධ්‍යම පරිසර අධිකාරිය,ප්‍රාදේශීය සභාව යන ආයතන ඉඩමට ගොස් ස්ථානීය පරික්ෂාවක් සිදු කර යම් යම් නිදෙර්ශ ලබාදුන් බවත් එම නිදෙර්ශ අනුව ප්‍රධාන කාරණාව ලෙස ජල පහසුකම පෙන්වා දුන් බවත් ඇළ රක්ෂිතයේ ඉදි කරමින් පවතින ළිඳ තහනම් කිරීම පළමුවෙන්ම කල නමුත් මෙම ළිඳ ඉදි කරමින් යන බවත් මාගර් රක්ෂිතය වෙන් කරන්න කියා වසරක් ගත වුවත් එම කටයුතු ඉටු නොවු බවත් වසර ගණනාවක් තිස්සේ ප්‍රදේශයේ දමිළ ජනතාව භාවිතා කල සුසානභූමිය එම අය විකුණා ඇති බවත් එම සුසානභූමිය මිළදී ගත් අය පැමිණ ඇති බවත් වතු ජනතාවගේ මරණයක් සිදු වු පසු ඉඩම් හිමියා රු.50000.00 ක වැනි මුදලක් ලබා දී ගම්පොල සුසානාගාරය වෙත එම අය යොමු කල බවත් දැනට මෙම අයට සුසානභූමියක් නොමැති බවත් පරිසර අධිකාරියෙන් සුසානභූමිය වෙන් කර දෙන ලෙස පැවසුවත් නොලැබුනු බවත් මෙම ඉඩමෙහි ජලය බැස යාමට පහසුකම් තිබූ නමුත් ඉඩම් හිමියා ගල් ගලවා වෙනත් අයට විකුණූ බවත් මේ වන විට මෙම ඉඩම වෙන්දේසි කරමින් පවතින බවත් මෙම වෙන්දේසිය නතර කරන ලෙසත් මෙම වෙන්දේසි කරන ඉඩම් වල නිවාස ඉදිකිරිමට සහ වීපී රේඛා සහතික ලබාගැනිමට සභාවෙන් ඉඩ නොදෙන ලෙසත් මෙම ඉඩම වෙන්දේසිය සම්බන්ධයෙන් ඔබතුමා ඉදිරිපත් වී මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට අයිති ඇළ රක්ෂිත ඉඩමක් බැවින් එතුමාවද දැනුවත් කරන ලෙසත් මධ්‍යම පරිසර අධිකාරියද දැනුවත් කරන ලෙසත් පර්චස් 10-15 ඉඩම් කොටස් වල නළ ළිං සාදන බවත් ජල මුලාශ්‍ර වල ගැටළු ඇති වන බවත් මෙම අක්කර 150ක පමණ ඉඩම කොටස් කිරිම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිදෙර්ශ ලබා දී ඇති බවත් තේ කමර්ාන්ත ශාලාව සහ වෙන්දේසිකරුවන් එකතුව මෙම ඉඩම කොටස් කල බවත් නමුත් මෙම අක්කර 150ක පමණ ඉඩම කොටස් කරනවා නම් වැවිලි කමර්ාන්ත අමාත්‍යාංශයේ,ඉඩම් කැබලි කිරිමේ මණ්ඩලයේ.තේ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු බවත් එම කිසිම අනුමැතියක් මොවුන් ගෙන නොමැති බවත් එනිසා සභාවෙන් නැවත විමශර්ණයක් කරන ලෙසත් මෙම ඉඩම් හිමිකාරිය නැවතත් ඉඩමක් කොටස් කර විකුණන බවත් කාමරීක නිළධාරි මහතාත් නිරීක්ෂණයට ගිය බවත් පානිය ජල පහසුකම් නැති බවත් පොදු ළිඳ අරමුණු කරගෙන ඉඩම් විකුණන බවත් එනිසා ඉඩම් හිමිකාරිය මෙම සභාවට කැඳවා විමශර්ණයක් කරන ලෙස මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

මෙම යෝජනාව මීට පෙරද සභාවට ඉදිරිපත් කල බවත් පුස්සතැන්න ඉඩම් කොටස් කිරිම සම්බන්ධව ප්‍රදේශයේ ජනතාව නිතර නිතර පොලීසි යන බවත් නිතර ගැටුම් ඇති වන බවත් පුස්සතැන්න වතුයායේ අවසර ලබාගත් කොටසට අමතරව තවත් කොටසක් වෙන්දේසිය සඳහා එළි පෙහෙළි කර ඇති බවත් මෙම ප්‍රදේශයේ කාපට් කල මාගර්යේ මායිමටම කපා ඇති බවත් එවිට එම

මාගර්ය කැඩී යාමට ඉඩ ඇති බවත් ඉඩම් හිමියා බලහත්කාරයෙන් මෙන් මෙය සිදු කරන නිසා සභාවට ඉඩම් කොටසක් පවරා ගත යුතු බවත් විශේෂයෙන් ජල මූලාශ්‍ර වල විශාල ගැටළු ඇති බැවින් ඉඩම් වෙන්දේසි කරනවානම් ජල විදුලි පහසුකම් කල යුතු බවත් නළ ළිං නිසා ජලය සිදී යන බවත් එනිසා කමිටුවක් පත් කර ගරු සභාපතිතුමා,ලේකම්තුමිය, සහ තමාවද ,ගරු මන්ත්‍රී මණ්ඩලයේ එම ප්‍රදේශයේ මන්ත්‍රීවරු මෙන්ම ඉඩම් හිමියා සහ ඉඩම් වෙන්දේසි කරන අයද ගෙන්වා ස්ථානීය පරික්ෂාවක් සිදු කලයුතු බවත් සඳහන් කරමින් ගරු උදය මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

2021.02.18 දිනැති මහ සභාව උඩපලාත ප්‍රාදේශීය සභාව

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

ඉඩම් කට්ටි කර විකුණන සමාගම් හෝ පුද්ගලයන් විශාල ලෙස ලාභ ලබන බවත් ඉඩම් කට්ටි කිරිම තුළින් එම ප්‍රදේශයේ පරිසරය,සදාචාරය ආදි සියල්ල නැති වී යන බවත් ලංකාවේ සියළුම ප්‍රදේශ වල ජනතාව ඉඩම් ගැනීමට පැමිණෙන බවත් කමිටුවක් සෑදිමේ අදහස යෝග්‍ය බවත් ගරු උප සභාපතිතුමා පැවසූ ආකාරයට කමිටුවක් සාදා සභාව මැදිහත් වි මෙම ප්‍රශ්නය විසදිය යුතු බවත් කමිටුව සඳහා ගරු උප සභාපතිතුමා,ගරු උදය දිසානායක මන්ත්‍රීතුමා,ගරු අගලවත්ත මන්ත්‍රීතුමා,ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

දිනයක් ඔබතුමන්ලා යොදාගන්නා ලෙසත් ප්‍රවාහන පහසුකම් සපයන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙම ගැටළුව විසදි ඇති බව තමා සිතූ බවත් මෙම ඉඩම් වෙන්දේසි කරන්නේ ලාභ ලැබීමට නිසා අපගේ වගකීම වනුයේ නීත්‍යානුකූලව සොය බලා චක්‍රෙල්ඛයට අනුව වෙන්දේසි ඉඩම් වලින් හොදම ඉඩම් කොටසක් ලබාගැනීම අපේ සභාවේ වගකීම බවත් නේවස්ග්‍රෝ ඉඩමේ අක්කර 50ක් වෙන්දේසි කිරීමේදී සභාවට ලබාගත් ඉඩම් කොටස් වලින් එක් කොටසක් පමනක් හොද තත්වයේ ඇති බවත් අපි කථා කරන දේ මසක් ඇතුලත විසදා ගත යුතු බවත් බ්ලැක්බන් ඉඩම සභාවේ අවසරයකින් තොරව බෙදා වෙන් කර ඇති බවත් නමුත් අපිගත් ක්‍රියා මාගර්යක් නොමැති බවත් අපි ගොඩනැගිලි සිතියම් අනුමත නොකරන බවත් අපි සොයාබලා වෙන්දේසි කරන අයට නීතියානුකූලව කටයුතු කල යුතු බවත් බ්ලැක්බන් ඉඩම් මිලදී ගත් අයට ජල විදුලි පහසුකම් නොමැති බවත් එනිසා වංචනිකව සිදුකරන කටයුතු නතර කලයුතු බවත් ජනතාවට යාමට පාරක් පවා නොමැති බවත් පුස්සතැන්න වත්තේ විවිධ පැමිනිලි ඇති බවත් සභාවට ලබා දී ඇති ඉඩම් කොටස් සුදුසු නොවන ඒවා බවත් මේ සම්බන්ධයෙන් නීතියානුකූලව කටයුතු කලයුතු බවත් සඳහන් කරමින් කමිටුව පත්කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

මේ සම්බන්ධයෙන් ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා සහ ගරු W ප්‍රේමතිලක මන්ත්‍රීතුමා අදහස් දක්වන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකු සභාවට අයත් ඉඩම් කොටස් මුදල් ලබාගෙන විකුනා ඇති බවත් එනිසා තමා එම ඉඩම් කොටස් ටික සභාවට ලබාදෙන ලෙස පැවසුව බවත් සයන්හිල් ඉඩම් වෙන්දේසියට තමා නොගිය බවත් කමිටුවක් පත්කර යැවූ බවත් පුස්සැල්ලාවේ ඉඩම් වෙන්දේසියට තමා නොගිය බවත් සියළු තැන්වල පවත්නා ගැටළු සොයාබැලීම සඳහා කමිටුවක් පත්කර පරීක්ෂාකර බලා කටයුතු කිරීම සුදුසු බවට තමා අදහස් කරන බවත් සභාපතිවරයා ලෙස තමා තනිව තීන්දු තීරණ නොගන්නා

බවත් සියළුදෙනා එකතුවී කටයුතු කරමු යැයිද තමා ප්‍රවාහන පහසුකම් සපයන බවත් ප්‍රදේශයේ මන්ත්‍රීවරු මැදිහත්වී මේ සම්බන්ධයෙන් සොයාබලා කටයුතු කල යුතු බවත් කමිටුව සතියට වරක් හෝ ගොස් ගැටළු නිවැරදි කර ගනිමු යැයිද මේ සම්බන්ධයෙන් තමාට දොස් නොපවරන ලෙසද දන්වන ලදි.

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*



<u>කමර්ාන්ත අනුමැතිය</u>

<u>කමර්ාන්ත යෝජනා</u>

<u>ගරු උදය දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.3) සමරකෝන්හේන දෙල්තොට කඩේ මාගර්ය සංවධර්නය කිරීම රු.500000.00 කමර්ාන්තය සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.4) කහවත්ත වෙදගෙදර කලියනාවත්ත මාගර්ය කොන්ක්‍රිට් කිරීම රු.150000.00 කමර්ාන්තය සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

(5) (2.5) කහවත්ත වෙදගෙදර සිට බෝගහ වත්ත හරහා ඇල්ලේ ගෙදර පාර කොටස සංවධර්නය කිරිම රු.150000.00 කමර්ාන්තය සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමාගේ සහ උදය දිසානායක මන්ත්‍රීතුමාගේ 2021 අයවැය ලැයිස්තුවේ ඉදිරිපත් කර ඇති යෝජනා වෙන වෙනම ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවත් දොළුව වෙළද සංකීණර්යේ සිවිලිම ගැසීම හා දෙපැත්තේ පඩිපෙල දැමීමේ යෝජනාව සහ වනහපුව ක්‍රිඩාංගනය සංවධර්නය කිරීම රු.1500000.00 කමර්ාන්තය,දොළුව ඩෙල්ටාවත්ත ක්‍රිඩාංගනය සංවධර්නය කිරීම රු.1500000.00 කමර්ාන්ත 2021 අයවැය ලැයිස්තුවේ ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනා සියල්ල ඉදිරිපත් කරන බව සදහන් කරන ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

තමාට ලැබෙන ප්‍රතිපාදන වලින් 2021 අයවැය ලැයිස්තුවේ ඉදිරිපත් කර ඇති යෝජනා 2 ක් යොමු කර ඇති බවත් 2021 අයවැය ලැයිස්තුවේ ඉදිරිපත් කර ඇති යෝජනා සියල්ල ලැයිස්තු ගත කර ඉදිරිපත් කරන ලෙසත් මාසෙන් මාසසට යෝජනා යොමු කිරීමට අවශ්‍ය නොවන බවත් සදහන් කරමින් දොළුව වෙළද සංකීණර්යේ සිවිලිම ගැසීම හා දෙපැත්තේ පඩිපෙල දැමීමේ යෝජනාව සහ වනහපුව ක්‍රිඩාංගනය සංවධර්නය කිරීම රු.1500000.00 කමර්ාන්තය,දොළුව ඩෙල්ටාවත්ත ක්‍රිඩාංගනය සංවධර්නය කිරීම රු.1500000.00 කමර්ාන්ත 2ත් 2021 අයවැය ලැයිස්තුවේ ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනා සියල්ල මේ වසරතුල ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

දොළුව වෙළඳ සංකීර්ණයේ සිවිලිම ගැසීම හා දෙපැත්තේ පඩිපෙල දැමීමේ යෝජනාව , වනහපුව ක්‍රීඩාංගනය සංවධර්නය කිරීම රු.1500000.00 කමර්ාන්තය,දොළුව ඩෙල්ටාවත්ත ක්‍රීඩාංගනය සංවධර්නය කිරීම රු.1500000.00 කමර්ාන්ත සහ 2021 අයවැය ලැයිස්තුවේ ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනා සියල්ල මේ වසරතුල ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

| අනු අංකය | සංවධර්න යෝජනාව | මුදල(රු.) | ගරු මන්ත්‍රීතුමාගේ මන්ත්‍රීතුමියගේ නම |
|---|---|---|---|
| (05) 1.8 | ගොනවුවෙල ගොවිසෙවන අසළ සිට නාය දෙසට යන මාගර්ය සංවධර්නය කිරිම | 400,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා |
| | වාරියගොඩ යාමිල්ල මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | |
| 09 | ගුරුකැලේ 24 අතුරු මාගර්ය සංවධර්නය කිරිම | 400,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු උපසභාපති එල්.එච්.එන්.ඒ. අමරසේන මහතා |
| | ගොඩවෙල වැල්ලතොට මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | |
| 10 | ඔරායන්වත්ත බස් නැවතුම අසල සිට බැද්දෙපිහිල්ල මාගර්ය සංවධර්නය කිරිම | 400,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඒ.එච්.ඒ.රත්නායක මහතා |
| | කාසල් මිල්ක්නැඹුල්නැව දක්වා මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | |
| | වෙදගෙදර සිට කලයනාවත්ත දක්වා මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | |
| 11 | වත්තෙහේන පුපුරැස්ස මාරිගයේ දේවාලය අසලින් ලිදට යන පඩිපෙල සංවධර්නය කිරිම | 100,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි අගලවත්ත මහතා |
| | පුපුරුස්ස පාරේ සිට දේවිකාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | මෛත්‍රි මාවතේ බෝක්කුව ඉදිකිරිම | 100,000.00 | |
| | ඩාට්‍රි පහල දේවාලය අසලින් ෆැක්ටරිය දෙසට යන මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| | ඉහලගම සොගමා ජනපද මාගර්යේ සිට ඔත්න කඩේ දෙසට ඇති මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| 12 | නාරංවිට අලවතුගොඩ නාගස අසල මාගර්ය සංවධර්නය කිරිම | 400,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ආර්.එම්.ආර්.දිනුක රත්නායක මහතා |
| | වැවතැන්න වසමේ දුෂාන්තමහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | |
| 13 | හපුගස්පිටිය ප්‍රජාශාලාවේ ඉහල කාමරයේ වැඩ අවසන් කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී සුභද්‍රා සමරනායක |

| | | | |
|---|---|---|---|
| | හපුගස්පිටිය කඩුගන්නාව මාගර්යේ ශාන්ත මහතාගේ නිවස අසල සිට මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | මිය |
| | හපුගස්පිටිය සඳසිරිවත්ත ජනපදයේ සි.රාජපක්ෂ මහතාගේ නිවස අසල සිට මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | හපුගස්පිටිය යකඩාදෙනිය කඩුගන්නාව පාර දක්වා ඇති පඩිපෙල සංවධර්නය කිරිම | 100,000.00 | |
| 14 | දුනුකේඋල්ල කළුගලවත්තේ අංක 03 පේලි කාමර දක්වා යන මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එච්.එම්.නිල් සුගත් මහතා |
| | වනහපුවේ සිට අක්කරමලේ දෙසට යන මාගර්ය සංවධර්නය කිරිම | 125,000.00 | |
| | දුනුකේඋල්ල අක්කර 66 ගම්මානයේ ජල ටැංකියක් ඉදිකිරිම | 100,000.00 | |
| | බෝමන්ට් මැද කොටසේ ජල ටැංකියක් ඉදිකිරම | 75,000.00 | |
| | දුනුකේඋල්ල අමුණුවල පිහිල්ල සංවධර්නය කිරිම | 50,000.00 | |
| | දුනුකේඋල්ල කහටදෙනිය පිහිල්ල සංවධර්නය කිරිම | 50,000.00 | |
| | දුනුකේඋල්ල ඉල්ලත්ත මඩ ළිඳ සංවධර්නය කිරිම | 50,000.00 | |
| | වනහපුව පිහිල්ල සංවධර්නය කිරිම | 50,000.00 | |
| 15 | ලෙවලන් ෆැක්ට්‍රි කොටසේ සුසාන භූමියේ මෘත ශරීර තැබිම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 500,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි වඩිවෙල් රවි මහතා |
| | ලෙවලන් එච්.එම්.කොටසේ පුපුරුස්ස ගලහා මාගර්යට පිවිසෙන අතුරු පාර කොන්ක්‍රිට් කිරිම | 200,000.00 | |
| 16 | නිව් පිකොක්වත්තේ එන්.පි.කොටසේ අංක 21,23 කාමරවලට යන පාර සංවධර්නය කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි තංගවේල් කාමරාජන් මන්ත්‍රිතුමා |
| | නිව් පිකොක්වත්තේ ඕ.පි.කොටසේ අරුණාසලම් මහතාගේ නිවස අසළ සිට දොරගල පාර දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | |
| | නිව් පිකොක්වත්තේ එන්.පි.කොටසට පි.වි.සි. නල ලබා දිම | 100,000.00 | |
| 17 | ස්ටෝෆීඩ් අත්කම් නිවාස සුසාන භූමියට යන මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එච්.එම්.යසස් බණ්ඩාර දෙණුවර මයා |
| | හිජ්රාගම මාගර්යේ සිට ෂිෆානා මහත්මියගේ නිවස දක්වා මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| | මිල්ලගස්පිටිය වසමේ අංකිලි පිටියේ සිට මැදගම්මැද්ද මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | ගග සිරිගම ක්‍රීඩා පිටියට යන මාගර්ය සංවධර්නය කිරීම | 200,000.00 | |
| 18 | වාරියගල බෙලින් ජනපදය හරහා නිල්ලඹ ගමට යන මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඩබ්. ප්‍රේමතිලක මහතා |

| | | | |
|---|---|---|---|
| | හල්ඔය හරහා ගල්ඔය අතර ඇතිකුඩා පාලම ඉදිකිරිම | 200,000.00 | |
| | වාරියගල හිල්සයිඩ් ජල යෝජනා ක්‍රමය සංවධර්නය කිරිම | 200,000.00 | |
| 19 | ඉහලගම හන්දිය අසලින් කැටේපිට දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරිම | 250,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ජ්.සමන්ත කුමාර ආරියදාස මහතා |
| | උඩගම මැදගම්මැද්ද සිට අම්බලම දක්වා ඇති මාගර්යේ පහල කොටස සංවධර්නය කිරිම | 200,000.00 | |
| | ඉහලගම ගල්පිහිල්ල ගමේ සිට කන්දේගම දක්වා ඇති පාර සංවධර්නය කිරිම | 200,000.00 | |
| | හුණුකොටුගම නාරංගස්කොටුව මාගර්යේ සමන් මහතාගේ නිවස අසල මාගර්යේ මුල්කොටස සංවධර්නය කිරිම | 50,000.00 | |
| 20 | යටිපියන්ගල සිට ගලත පාසල දක්වා දිවෙන මාගර්යේ පඩිපෙලේ සහ කාණු පද්ධතියේ ඉතිරි කොටස සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි රන්ජන් රාජපක්ෂ මහතා |
| | කැකුලන්ද ඉහල කොටසේ සිරිමා මියගේ නිවස අසල සිට ඇති මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| | කැකුලන්ද පහළ කොටස ගම මැද මාගර්ය ඩෝසර් කිරීම | 100,000.00 | |
| | නෝනාමලේ ජනපදය නිමල් මහතාගේ නිවස අසළ සිට රූපසිංහ මහතාගේ නිවස දක්වා ඇති මාගර්යේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 200,000.00 | |
| 21 | 1160 හල්ඔය වසමේ මාතෘ සායනය ඉදිරිපිට ඇති සභාව සතු බස් නැවතුම්පල සංවධර්නය කිරීම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී ඩිමෝෂි වෙලපලාගම මිය |
| | 1161 වාරියගල වසමේ ලෝවර් කොටසේ රංජිත් මයාගේ නිවස මාගර්යේ ඉතිරි කොටස සංවධර්නය කිරිම | 200,000.00 | |
| | 1161 වාරියගල වසමේ බේලින් ජනපදයේ කුට්ටිගල් අතුරා ඇති මාගර්යේ ඉතිරි කොටස සංවධර්නය කිරිම | 300,000.00 | |
| 22 | මෙ.කළුගමුව ආර්.එම්.ජ්.සුමනදාස මහතාගේ නිවස අසල මාගර්යේ පඩිපෙල සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ආර්.පාලිත අබේරත්න මයා |
| | ගල්ඔය හදබිම ජනපදයේ කෝවිල අසල පඩිපෙල සංවධර්නය කිරිම | 200,000.00 | |
| | පිහිඹියාහේන ජනපදයේ ඉහල කොටසට යන මාගර්යේ කාණු පද්ධතිය සංවධර්නය කිරිම | 200,000.00 | |
| | පිහිඹියාහේන ජනපදයේ පහල කොටස දෙල්ගහමුල මාගර්යේ පඩිපෙල සංවධර්නය කිරිම | 100,000.00 | |
| 23 | රෙට්ටාබෝක්කුව මාගර්ය ගල් තාර දමා සංවධර්නය කිරිම | 400,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු |

| | | | |
|---|---|---|---|
| | ගනේගොඩ ප්‍රධාන මාගර්යේ සිට අතුරු මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | මන්ත්‍රිනී එස්.ඒ.වත්සලා සේනානායක මිය |
| | පිහිඹියාහේන අතුරු මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| 24 | ගම්පලවත්ත බුදුමැදුර අසලින් කොබ්බැවලට යන මාගර්යේ ඇති කාණු පද්ධතිය ආරක්ෂිත කොන්ක්‍රිට් පියන් දමා සංවධර්නය කිරිම | 150,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ආර්.එම්.කිතරී රත්නායක මයා |
| | ගම්පොලවත්ත නව සේවා පියස අසළින් ගමට යන පාර සංවධර්නය කිරිම | 200,000.00 | |
| | අටුවාවත්ත වසමේ පොල්වත්ත ග්‍රාමයට යන මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| | අටුවාවත්ත වසමේ පොදු ගම්සභා පාර සංවධර්නය කිරිම | 150,000.00 | |
| 25 | මොරහේන කුඩුගල මාගර්ය සංවධර්නය කිරීම | 700,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඩී.ජී.ජයන්ත කිතරීසිංහ මහතා |
| 26 | උඩගම මාලිගාතැන්න එම්.ජේ.මහින්ද අබේසූරිය මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරීම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී වයලා විනෝදනි චන්ද්‍රපාල මිය |
| | මැදගම්මැද්ද ලෝලන් දෙනිය පිහිල්ල අසලින් නාග ශ්‍රි බෝධිවිහාරය දක්වා පාර කොන්ක්‍රිට් කිරිම | 100,000.00 | |
| | උඩගම අම්බලම සිට මැදගම්මැද්ද දක්වා පාරේ විජිතානන්ද මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | හුනුකොටුගම සමගි සුභ සාධක සමිතියේ සොහොන් භූමියට පිවිසෙන මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | ඉහලගම ගොවි කේන්ද්‍රයට පිවිසෙන මාගර්යේ කොටසක් කොන්ක්‍රිට් කිරිම | 100,000.00 | |
| | ඉහලගම අගරයාකුඹුර පාර කොන්ක්‍රිට් කිරිම | 100,000.00 | |
| 27 | පරණ නිල්ලඹ අප්පපිල්ල කඩය අසලින් ගමට යන මාගර්යේ කාණු පද්ධතිය කොන්ක්‍රිට් යොදා සංවධර්නය කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී ජී.ශ්‍රියාමාලා ඇතුගල්පේ මිය |
| | නිල්ලඹ ග්‍රාම සේවා වසමේ මහ කැලේ කොටසේ ඩී.ජී.දසනායක මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| | ගුරුකැලේ හන්දියේ සිට ගාමන්ට් මාගර්යේ පහල ඇති බී.ඒ.මානෙල් මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරීම | 200,000.00 | |
| 28 | හපුගස්පිටිය වනවාස පන්සල පාර සංවධර්නය කිරීම | 500,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි |

| | | | |
|---|---|---|---|
| | හපුගස්පිටිය ප්‍රධාන මාගර්යේ සරත් මහතාගේ නිවස අසළ පැති බැම්ම ඉදිකිරිම | 200,000.00 | සි.බි.වේරපිටිය මහතා |
| 29 | ඉලංගවත්ත ප්‍රජාශාලාවේ පලවෙනි මහළ සේවා පියස ඉදිකිරිම | 500,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එම්.ජේ.එම්.මුරාඩ් මයා |
| | උනම්බුව මයුර වලව්ව අසළ රියාස් මොහොමඩ් මයාගේ නිවස ඉදිරිපිට කාණුව හා කාණු ආවරණය ඉදිකිරිම | 150,000.00 | |
| | ඉලංගවත්ත නජීම් මයාගේ නිවස ඉදිරිපිට මාගර්ය සංවධර්නය කිරිම | 50,000.00 | |
| 30 | ස්ටෙලන්බගර් විඩින්හි ආරුමුගන් මහතාගේ නිවස අසලින් යන ජනපද මාගර්ය සංවධර්නය කිරීම | 100,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී පි. සෙල්වපුවනේශ්වරි මිය |
| | රුවන්පුර විහාරස්ථානයට යන මාගර්ය සංවධර්නය කිරීම | 200,000.00 | |
| | ස්ටෙලන්බගර් විඩින්හි පල්ලිය අසලින් යන මාගර්ය සංවධර්නය කිරිම | 400,000.00 | |
| 31 | වටගොඩ (හල්ඔය) ජනපදයේ කොවිල අසලින් නෝමන් මහතාගේ නිවස ප්‍ර දේශයට යන මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඩි.ජී.හේමකුමාර නයනානන්ද මයා |
| | වටගොඩ (හල්ඔය) ජනපදයේ සිරි රනවිරුවිහාරයට යන මාගර්යේ දමිල නිවාස ප්‍ර00 දේශයට දකුණු පසට මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | |
| | ගල්ඔය ප්‍රධාන මාගර්යේ සුනිල් වෙලද සැල අසලින් ඉහලට යන මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | ගනේගොඩ ග්‍රාම නිළධාරි තුමාගේ ගග ප්‍ර දේශයට යන මාගර්යේ දකුණු පසට යන මාගර්ය සංවධර්නය කිරීම | 150,000.00 | |
| | කොට්ටගස් හන්දියෙන් ඉහලට ඉල්ල ගොල්ල මාගර්යේ ගම මැදින් යන පියල් මයාගේ නිවස අසල බෝක්කුව අළුත් වැඩියා කිරීම | 100,000.00 | |
| 32 | පුස්සැල්ලාව වටගොඩ පතන ගම්මානයේ අළුබෝගොල්ල මාගර්යේ පැතිබැම්ම ඉදිකිරිම | 700,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී වයි.ජී.සුසිලාවති මිය |
| 33 | පල්ලෙදෙල්තොට වෙදහැට පහළ මාගර්යේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එම්.ජී.යු.ජයපති මයා |
| | නව නිල්ලඹ ග්‍රාම නිළධාරි වසමේ කුරුස හන්දිය අසලින් ඉහළට යන මාගර්යේ ගල් පඩි කොන්ක්‍රිට් කිරිම | 100,000.00 | |
| | නව නිල්ලඹ හාල්වත්ත වතු නිවාස සඳහා පල්ලෙදෙල්තොට ඔය අසළ නාන තොටුපළ සංවධර්නය කිරිම | 200,000.00 | |
| | නව නිල්ලඹ කායර්ාල හන්දියෙන් පහළ පාරේ අතුරු මාගර්ය කොන්ක්‍රිට් කිරිම | 200,000.00 | |
| 34 | නිව් මෙල්ෆට් නිවාස යෝජනා ක්‍රමයට යන මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එම් නිලමේගම් මයා |

| | | | |
|---|---|---|---|
| | බ්ලැක්ෆොරස්ට් වත්තේ ළමා නිවාසයට යන මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | |
| | මෙල්ෆට් වත්තේ රාජරත්නම් නිවසට යන මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | |
| | නිව් මෙල්ෆට් වත්තේ ගමට යන මාගර්යේ කාණු පද්ධතිය සංවධර්නය කිරිම | 250,000.00 | |
| 35 | දුනුකේඋල්ලල්ල මාගර්යේ සිට වැරැල්ලපිටිය දක්වා මාගර්යේ කාණු පද්ධතිය සංවධර්නය කිරිම | 150,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඩබ්.ඩි.ජී.ගුනතිලක මහතා |
| | සැන්කුවාර් උඩ කොටස ඇල හරහා පාලම ඉදිකිරිම | 100,000.00 | |
| | පන්සල අසලින් අංකෙලි පිටියට යන මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | අඹවත්ත මාගර්යේ බෝක්කුව ඉදිකිරිම | 150,000.00 | |
| | සැන්කුවාර් ජනපදයට යන මාගර්ය සංවධර්නය කිරීම | 200,000.00 | |
| 36 | උඩුදෙනිය ජන උදාන ගම්මානයට යන මාගර්ය කොන්ක්‍රිට් කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ජී.ඒ. අරුණ ප්‍රසන්න මයා |
| | මුල්ගම රණවිරු ස්මාරකයට යන මාගර්ය සකස් කිරිම | 200,000.00 | |
| | හුණුගල ගම මැදින් යැරෝ දක්වා මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | |
| 37 | එගොඩ කළුගමුව පොල්මණ්ඩිය පාර සංවධර්නය කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඒ. සි.එම්. ෆසාල් මයා |
| | එගොඩ කළුගමුව සත්තාර් මහතාගේ නිවස අසළින් යන පාර සංවධර්නය කිරිම | 200,000.00 | |
| | සැලුන් හන්දියේ සිට ටැංකි පාරට සම්බන්ධ වන පාර සංවධර්නය කිරිම | 200,000.00 | |
| 38 | බ්ලැක්ෆොරස්ට් වාඩිවත්ත ජල පද්ධතිය සංවධර්නය කිරිම | 700,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ආර්.ඒ.ධනුෂ්ක ඉන්ද්‍රජිත් මයා |
| 39 | මාඋස්සාව මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී චමිලා ෆොන්සේකා මිය |
| | සැන්කුවාර් කමලාවති මියගේ නිවස අසල සිට සුජී මහතාගේ නිවස දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරිම | 50,000.00 | |
| | නුවරඑලිය මාගර්යේ සින්නයියා මහතාගේ නිවස ඉදිරියෙන් ඇති මාගර්ය සංවධර්නය කිරීම | 100,000.00 | |
| | මිල්ලගස්පිටිය වසමින් ආරම්භ වී මැදගම මැද්ද දක්වා මාගර්ය සංවධර්නය කිරීම | 100,000.00 | |
| | වැරැල්ලපිටිය වසමේ අම්බලම් පිහිල්ල සංවධර්නය කිරීම | 150,000.00 | |
| | එකේ කණුව මාගර්ය පාළම සංවධර්නය කිරීම | 100,000.00 | |
| | කලවැල්ගොල්ල මාගර්යේ ඇති නානපිහිල්ල සංවධර්නය කිරීම | 100,000.00 | |

| | | | |
|---|---|---|---|
| 40 | මාවතුර ගලත පාරේ රත්නායක මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඩී.ජී.පි.මනෝජ් තිලකරත්න මයා |
| | කළුගල්හින්න විමලසේන මහතාගේ නිවස අසලින් යන මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | |
| | වැලිගග කළුගල්හින්න මාගර්යේ ඉතිරි කොටස සංවධර්නය කිරිම | 200,000.00 | |
| 41 | වහුගපිටියේ සිට පහලවෙල ගම හරහා යන මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ඩී.එම්.ඩී. මංජුල දිසානායක මයා |
| | වජ්ලි ජනපදයේ ගම මැද මාගර්ය සංවධර්නය කිරිම | 150,000.00 | |
| | වහුගපිටිය සරස්වති පාසල අසලින් මාගර්යේ බෝක්කුව ඉදිකිරිම | 100,000.00 | |
| | වජ්ලි ජනපදයේ පාර දෙක කෝවිල අසල ඇති බෝක්කුව ඉදිකිරිම | 150,000.00 | |
| 42 | ගම්පොල පුපුරැස්ස මාගර්යේ ප්‍රධාන මාගර්යට මායිම් ව පුපුරැස්ස වංගුවේ ගෙදර අසලින් පරන පට්ටිය ගම දක්වා දිවෙන අතුරු මාගර්ය කොන්ක්‍රිට් කිරිම | 700,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි ආර්.එම්.පි.බණ්ඩාර මයා |
| 43 | මුල්ගම දෙනියේ සිට කුඩා ගම්මාන මාගර්ය සංවධර්නය තිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි පාලිත මහින්ද ජිනදාස මයා |
| | පිටවල කෝල්ග්‍රින් ජනපනදයේ පිවිසුම් මාගර්ය සංවධර්නය කිරිම | 250,000.00 | |
| | හුණුගල අඹගහවත්ත හරහා ගංගොඩවත්ත පාර සංවධර්නය කිරිම | 250,000.00 | |
| 44 | කහවත්ත මානකුලගම මාගර්ය කොන්ක්‍රිට් කිරීම | 400,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එස්.ඒ.නවරත්න බණ්ඩා මයා |
| | කහවත්ත වෙදගෙදර කලියනාවත්ත මාගර්ය කොන්ක්‍රිට් කිරීම | 150,000.00 | |
| | කහවත්ත වෙදගෙදර සිට බෝගහ වත්ත හරහා ඇල්ලේ ගෙදර පාර කොටස සංවධර්නය කිරිම | 150,000.00 | |
| 45 | කාතරීගේෂන් නිවාස සදහා යන මාගර්ය සංවධර්නය කිරිම | 200,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි කනගරත්නම් මයා |
| | සෙල්වකන්ද ආමිනිගම මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | |
| | සෙල්වකන්ද වත්ත පත්තිනි දේවාලයට යන මාගර්ය සංවධර්නය කිරිම | 100,000.00 | |
| | නයාපාන උඩකොටස සදහා පානිය ජලය සැපයිම | 100,000.00 | |
| 46 | ගලත ගම මැද මාගර්ය සංවධර්නය කිරිම | 300,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිනී කේ.ඩබ්.වරාහේන මිය |
| | කැකුලන්ද එගොඩ කොටස මාගර්ය සංවධර්නය කිරිම | 400,000.00 | |
| 47 | සමරකෝන්හේන දෙල්තොට කඩේ මාගර්ය සංවධර්නය කිරීම | 500,000.00 | ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි උදය දිසානායක මයා |
| | පන්විලතැන්න නගරය අසලින් මාළිහාවට අයත් ඉඩම හරහා යන මාගර්ය සංවධර්නය කිරීම | 200,000.00 | |

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(6) කාරක සභා වාර්තා *කමිටු වාතරා* ඉදිරිපත් කිරීම**

1.ජනවාරි මාසයට අදාළ ධාවන සටහන් වාර්තා

2. උඩපළාත ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව 2021.01.27

2021.02.18 දිනැති මහ සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව

3. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාර්තාව 2021.01.29

4.ටෙන්ඩර් වාර්තා අනුමැතිය සඳහා සභාවට ඉදිරිපත් කරන ලදි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

ඉදිරිපත් කර ඇති සියළුම කාරක සභා වාර්තා *කමිටු වාතරා* සියල්ල පිලි ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(7) ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම -**

2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව පිලිගැනීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සඳහා සභාවට යොමු කරමින් නිවාඩු ඉල්ලීම් ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ලිඛිතව ඒ බව සභාවට ඉදිරිපත් කරන ලෙසත් සඳහන් කරන ලදි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

***ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමා***

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**8. වෙනත්**

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

විශේෂයෙන් තමා මෙම අවස්ථාව ඉල්ලා සිටියේ අපේ ගරු උප සභාපතිතුමාට නිල වශයෙන් ඉහල තනතුරක් ලැබීම සම්බන්ධයෙන් බවත් එතුමාට ගම්පොල මැතිවරණ කොට්ඨාශයේ සම සංවිධායක



**ගරු කීතරී මන්ත්‍රීතුමා**

තනතුර සමගි ජන බලවේගයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ අක්සනින් ලබාගත් බවත් අපේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන අපේ උප සභාපතිතුමාට ලද අවස්ථාව ගැන අපි ආඩම්බර වන බවත් ක්‍රියාකාරි දේශපාලනයේ සහ සමාජසේවා කටයුතුවල යෙදෙමින් තරුණයෙකු ලෙස උඩපළාත ප්‍රාදේශීය සභාව තුලින් ආරම්භකල දේශපාලන ගමන රටේ ඉහලම තනතුර දක්වා යාමට ගරු උප සභාපති අසේල අමරසේන මහතාට සුභ පැතුම් එක් කරන බව සදහන් කරන ලදි.

**ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා**

ගරු උප සභාපති අසේල අමරසේන මහතාට උඩපළාත ප්‍රාදේශීය සභාව නියෝජනය කරන අපේ කණ්ඩායමේ සියළු දෙනාගේ සුභාසිංශන ගෙන එන බවත් එතුමාට දේශපාලන දිවියේ ඉහලම තනතුර දක්වා යාමටඅවශ්‍ය ශක්තිය ලැබේවායි ප්‍රාථර්නා කරන ලදි.

**ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා**

අපි මොන මොන දේශපාලන මතවාද දැරුවත් මෙතුමාට ලැබුනු අවස්ථාව සම්බන්ධයෙන් අපේ පක්ෂ කණ්ඩායමේ සතුට පලකරන බවත් අසේල මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් ප්‍ර දේශයේ ජනතාව තුල විශේෂ පැහැදීමක් ඇති බවත් පසුගිය රජය කාලයේ විශාල වැඩ කොටසක් ගම්පොල ආසනය තුල ඉටුකල බවත් එතුමා ගම්පොල ආසනයතුල පක්ෂ පාට භේදයෙන් තොරව කරදරකාරි අවස්ථාවල ජනතාවට සේවය කරන අයෙකු බවත් ඉතිහාසයේ ප්‍රාදේශීය සභාවේ සිට ආසන සංවිධායක තනතුර ලබාගත් කිසිවෙකු නොමැති බවත් එතුමාට දේශපාලන දිවියේ ඉහල තනතුරක් ලැබීම සම්බන්ධයෙන් සුභාශිංෂණ ප්‍රාථර්නා කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 පෙබරවාරි මස මහ සභාවට සහභාගී වු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් භාෂා පවර්ථර්ක මහතාටත්,ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට දළදා සමිදු පිහිට ප්‍රාථර්නා කරමින් ප.ව.12.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම් සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව